# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 5 ශ්‍රේණිය - පරිසරය ( ඔක්තෝබර්-1 සතිය )

## 13 තේමාව - පොළොව හා අහස

❖ ක්‍රියාකාරකම 1

පුතාලා දන්නවද අපට වසර පුරාම එකම විදියට වැසි ලැබෙන්නේ නැති බව. යම් යම් මාසවල එක් එක් ප්‍රදේශවලට වැසි ලැබෙනවා. ඒ කාලවල ඒ ඒ ප්‍රදේශවලට ගැළපෙන සමහර වගා කටයුතු ආරම්භ කරනවා. එක් එක් මාසවල වැසි ලැබෙන ආකාරය පිළිබඳවත් ඒ ඒ කාලවලදී වගාකටයුතු කරන ආකාරය පිළිබඳවත් පුතාලා නිවසේ වැඩිහිටි අයගෙන් අසා දැනගන්න.

❖ ක්‍රියාකාරකම 2.

පුතාලාගෙ නිවස අවට ප්‍රද්ශයේ වැසි කාලයට පස සෝදායාමට ලක් වී ඇති ස්ථාන නිරීක්ෂණය කරන්න. එසේ පස සෝදායාමට ලක්වන්නේ කෙසේ ද කියා නිරීක්ෂණය කරන්න. සමහර ස්ථාන පමණක් එසේ වන්නේ ඇයිද කියා වැඩිහිටියන්ගෙන් අසා දැනගන්න.

❖ ක්‍රියාකාරකම 3.

නිවසේ වැඩිහිටියන් සමඟ එකතු වී නිවස අවට ප්‍රදේශයේ පස සෝදායන ස්ථානයක් බලා එය වළක්වා ගැනීමට පස ආවරණය වන පරිදි ඔබට කළ හැකි දෙයක් කරන්න. (තණකොළ වැවීම, ගල් බැම්මක් බැඳීම වැනි දෙයක්)

- පස සෝදා යාම වළක්වා ගැනීමට කළහැකි දේවල් 5ක් ලියන්න.

❖ E nanapiyasa 5 ශ්‍රේණිය පරිසරය -13 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.